ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2019/05/21 |

## උද්ධමනය 2019 අප්‍රේල් මාසයේ දී ඉහළ යන ලදී

ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100)[1] ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, ආහාර සහ ආහාර නොවන යන කාණ්ඩ දෙකෙහිම අයිතමයන්හි මිලගණන්වල සිදු වූ මාසික ඉහළ යෑම් හේතුවෙන්, 2019 මාර්තු මාසයේ පැවති සියයට 2.9 හි සිට 2019 අප්‍රේල් මාසයේ දී සියයට 3.6 දක්වා ඉහළ ගියේය. මේ අතර, 2019 අප්‍රේල් මාසයේ දී, ආහාර කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය සියයට -1.2 ක් වූ අතර ආහාර නොවන කාණ්ඩයෙහි උද්ධමනය අඛණ්ඩව සිව්වන මාසයටත් ඉහළ යමින් සියයට 7.5 ක් ලෙස වාර්තා විය.

**මතුපිට උද්ධමනය**

ලක්ෂ්‍යමය උද්ධමනය : 3.6%

වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 1.9%

මාසික වෙනස : 0.7%

**මූලික උද්ධමනය**

ලක්ෂ්‍යමය උද්ධමනය : 6.3%

වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 3.7%

මාසික වෙනස : 0.6%

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජා.පා.මි දර්ශකයෙහි වෙනස, 2019 මාර්තු මාසයේ පැවති සියයට 1.7 හි සිට 2019 අප්‍රේල් මාසයේ දී සියයට 1.9 දක්වා ඉහළ ගියේය.




මාසික වෙනස් වීම සලකා බැලීමේදී, ආහාර සහ ආහාර නොවන යන කාණ්ඩ දෙකෙහිම

[1] ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබයි.

අයිතමයන්හි මිලගණන්වල දක්නට ලැබුණු ඉහළ යෑම් හේතුවෙන්, 2019 අප්‍රේල් මාසයේදී ජා.පා.මි.ද. සියයට 0.7 කින් ඉහළ ගියේය. ආහාර කාණ්ඩයෙහි එළවළු, කිරි පිටි, අර්තාපල්, මාළු, දෙහි සහ ලොකු ලූණු මිලගණන්වල සැලකියයුතු ඉහළ යෑම් වාර්තා විය. මීට අමතරව, ආහාර නොවන කාණ්ඩයෙහි මද්‍යසාර පාන වර්ග සහ දුම්කොළ; ප්‍රවාහන; විවිධ භාණ්ඩ හා සේවා; සෞඛ්‍යය; සහ රෙදිපිළි හා පාවහන් උපකාණ්ඩයන්හි අයිතමවල මිලගණන් මෙම මාසය තුළ දී ඉහළ ගියේය.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන ජා.පා.මි දර්ශකයෙහි මූලික උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2019 මාර්තු මාසයේ දී වාර්තා වූ සියයට 5.8 හි සිට 2019 අප්‍රේල් මාසයේ දී සියයට 6.3 දක්වා ඉහළ ගියේය. මේ සඳහා, ආහාර කාණ්ඩයෙහි, ප්‍රධාන වශයෙන් කිරි පිටි, සහ ආහාර නොවන කාණ්ඩයෙහි මද්‍යසාර පාන වර්ග සහ දුම්කොළ; සහ විවිධ භාණ්ඩ හා සේවා උපකාණ්ඩයන්හි මිලගණන් ඉහළ යෑම හේතු විය. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය ද 2019 මාර්තු මාසයේ දී වාර්තා වූ සියයට 3.3 හි සිට 2019 අප්‍රේල් මාසයේ දී සියයට 3.7 දක්වා ඉහළ ගියේය.

**ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම**

**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) |
| 2017 | මැයි | 121.8 | 123.0 | 0.7 | 0.4 | 7.1 | 4.7 | 6.1 | 6.4 |
| | ජුනි | 123.4 | 123.1 | 1.3 | 0.1 | 6.3 | 4.1 | 6.1 | 6.1 |
| | ජූලි | 122.4 | 122.9 | -0.8 | -0.2 | 6.3 | 4.2 | 6.2 | 5.9 |
| | අගෝස්තු | 122.3 | 123.0 | -0.1 | 0.1 | 7.9 | 4.8 | 6.5 | 5.8 |
| | සැප්තැම්බර් | 123.3 | 123.1 | 0.8 | 0.1 | 8.6 | 4.6 | 6.8 | 5.7 |
| | ඔක්තෝබර් | 124.8 | 123.1 | 1.2 | 0.0 | 8.8 | 4.1 | 7.1 | 5.6 |
| | නොවැම්බර් | 126.4 | 123.8 | 1.3 | 0.6 | 8.4 | 2.8 | 7.5 | 5.2 |
| | දෙසැම්බර් | 126.6 | 123.8 | 0.2 | 0.0 | 7.3 | 2.7 | 7.7 | 4.9 |
| 2018 | ජනවාරි | 125.8 | 123.9 | -0.6 | 0.1 | 5.4 | 2.1 | 7.6 | 4.5 |
| | පෙබරවාරි | 123.7 | 124.4 | -1.7 | 0.4 | 3.2 | 2.0 | 7.2 | 4.1 |
| | මාර්තු | 122.8 | 124.6 | -0.7 | 0.2 | 2.8 | 1.9 | 6.7 | 3.6 |
| | අප්‍රේල් | 122.9 | 124.8 | 0.1 | 0.2 | 1.6 | 1.9 | 6.1 | 3.3 |
| | මැයි | 124.3 | 125.1 | 1.1 | 0.2 | 2.1 | 1.7 | 5.7 | 3.1 |
| | ජුනි | 126.5 | 125.3 | 1.8 | 0.2 | 2.5 | 1.8 | 5.3 | 2.9 |
| | ජූලි | 126.6 | 125.7 | 0.1 | 0.3 | 3.4 | 2.3 | 5.1 | 2.7 |
| | අගෝස්තු | 125.4 | 126.3 | -0.9 | 0.5 | 2.5 | 2.7 | 4.7 | 2.5 |
| | සැප්තැම්බර් | 124.4 | 126.9 | -0.8 | 0.5 | 0.9 | 3.1 | 4.0 | 2.4 |
| | ඔක්තෝබර් | 124.9 | 127.3 | 0.4 | 0.3 | 0.1 | 3.4 | 3.3 | 2.4 |
| | නොවැම්බර් | 127.7 | 127.6 | 2.2 | 0.2 | 1.0 | 3.1 | 2.7 | 2.4 |
| | දෙසැම්බර් | 127.1 | 127.6 | -0.5 | 0.0 | 0.4 | 3.1 | 2.1 | 2.4 |
| 2019 | ජනවාරි | 127.3 | 130.2 | 0.2 | 2.0 | 1.2 | 5.1 | 1.8 | 2.7 |
| | පෙබරවාරි | 126.7 | 131.3 | -0.5 | 0.8 | 2.4 | 5.5 | 1.7 | 3.0 |
| | මාර්තු | 126.4 | 131.8 | -0.2 | 0.4 | 2.9 | 5.8 | 1.7 | 3.3 |
| | අප්‍රේල් | 127.3 | 132.6 | 0.7 | 0.6 | 3.6 | 6.3 | 1.9 | 3.7 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව